# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## අතිරේක අධ්‍යක්ෂ - (01)

තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් තනතුරු ඇබෑර්තුව සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අතිරේක අධ්‍යක්ෂ**

**රැකියා විස්තරය :**

නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ හා ව්‍යාප්ති අධ්‍යක්ෂවරු සමග පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය, අධීක්ෂණය හා අගැයුම් කිරීම සහ පර්යේෂණ අංශවල/ ඒකකවල, ව්‍යාප්ති අංශවල, පර්යේෂණ, තාක්ෂණික හා අනෙකුත් කාර්ය මණ්ඩලවල මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා අධීක්ෂණය ද සමග අධ්‍යක්ෂ විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරිද අයත් වේ.

**බාහිර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යා /කෘෂිකර්ම හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ පළමු හෝ දෙවන පංතියේ ඉහළ පෙළ වසර හතරක (04) විශේෂ උපාධියක් හා අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් PhD උපාධියක්.

**සහ**

පිළිගත් ආයතනයක කළමනාකරණ තලයේ හා කළමනාකරණ හෝ ව්‍යාප්ති පළපුරුද්ද සමග අවම වසර දහ අටක (18) පර්යේෂණ පළපුරුද්ද තිබිය යුතු අතර, එයින් වසර දහයක් (10) PhD උපාධිය ලබාගත් පසුව විය යුතු අතර, සනාථ කළ සේවා වාර්තාවක් සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.

**සහ**

පර්යේෂණ විද්‍යාඥයන්/ ව්‍යාප්තිදයකයන් ඇතුළත් බහු විෂයානුයුක්ත කණ්ඩායම්හට නායකත්වය හා දිශානතිය ලබාදීමට සනාථ කළ හැකියාවක් තිබිය යුතුය. මානව හා අනෙකුත් සම්පත් සම්බන්ධ යෝග්‍ය ක්‍රියාවේ යෙදවීමේ හා කාර්යක්ෂම කළමනාකරණයේ පළපුරුද්ද සතුවීම අමතර සුදුසුකමකි.

**අභ්‍යන්තර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04), දෙවන පංතියේ (Second Class Division) විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක් සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ PhD උපාධියක් සහ වසර තුනක (03) නියෝජ්‍ය අධ්‍යක්ෂ – පර්යේෂණ / ව්‍යාප්ති ලෙස සතුටුදායක සේවා කාලයක් හෝ TRI ආයතනයේ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී/ ප්‍රධාන උපදේශක නිලධාරී තනතුරක වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්.

**හෝ**

විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියක් සමග වසර දෙකක (02) පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ PhD උපාධියක් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ – පර්යේෂණ/ ව්‍යාප්ති තනතුරක වසර තුනක (3) සතුටුදායක සේවා කාලයක් හෝ TRI ආයතනයේ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී/ ප්‍රධාන උපදේශක නිලධාරී තනතුරක වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්

**සහ**

බහු විෂයානුයුක්ත පර්යේෂණ විද්‍යාඥයන් කණ්ඩායමකට නායකත්වය හා දිශානතිය ලබාදීමට සනාථ කළ හැකියාව තිබිය යුතුය. මානව හා අනෙකුත් සම්පත් සම්බන්ධ යෝග්‍ය ක්‍රියාවේ යෙදවීමේ හා කාර්යක්ෂම කළමනාකරණයේ පළපුරුද්ද සතුවීම අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය :**

HM 2-1 (2016)(I) රුපියල් 91,645 – 12X2,700– රුපියල් 124,045 (මසකට)

**වයස :**

අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, 50 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් ප්‍රතිලාභ :**

i) පවත්නේ නම් නවාතැන් (පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස) පහසුකම් හෝ ඒ වෙනුවට යම් ගෙවීමක් ලබාදෙනු ඇත.

ii) ආයතනයේ දැනට පවත්නා නියමයන් ප්‍රකාරව වන වෛද්‍ය යෝජනා ක්‍රමය මගින් වෛද්‍ය ප්‍රතිලාභ ලබාදෙනු ඇත.

iii) **අර්ථසාධක අරමුදල :** තෝරාගත් අයදුම්කරු විසින් තම මාසික වැටුපෙන් 10% දායකත්වයක් කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා 15% දායකත්වයක් දරනු ඇත. එයට අමතරව, ආයතනය විසින් 3% දායකත්වයක් සේවක භාර අරමුදලටද ලබාදෙනු ඇත.

iv) අභ්‍යන්තර කම්කරු ශ්‍රම.

v) තේ පර්යේෂණ ආයතනයේ තනතුරට අදාළ වන අනෙකුත් ආන්තික ප්‍රතිලාභ ද හිමිය.

මෙම තනතුර ස්ථිර එකකි. සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව, උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතිකවල පිටපත්, නවෝත්පාදක කුසලතා හා පරිපාලන ප්‍රවීණතාවයන්වලට අදාළ විද්‍යාත්මක සඟරා ප්‍රකාශන හා වෙනත් සාක්ෂි සමග අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා හා දැනුම තක්සේරු කර බැලීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයුරින් ඉදිරිපත් කෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත.

කරුණාකර, තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත ප්‍රවිෂ්ට ගූගල් ආකෘතියෙන් ඉල්ලුම් කරන විස්තර උඩුගත කොට පසු විපරම් කටයුතු සඳහා සම්පූර්ණ කළ අයදුම්පත, සහායක ලේඛන සමග, පහත සඳහන් අය වෙත 2024 අප්‍රේල් 16 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. එසේම අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**

**ශාන්ත කූම්බ්ස්, තලවාකැලේ.**